# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

රාහුල් සමන්ත හෙට්ටිආරච්චි
405/1, පන්සල පාර,
වාඳුරුප්ප,
අම්බලන්තොට

**අභියාචක**

**අභියාචනා අංකය :**
**1014/2021**

**එදිරිව**

ජාතික ජලජ සම්පත්
පර්යේෂණ සහ සංවර්ධිත
නියෝජිතායතනය
කාක දූපත
මට්ටක්කුලිය
කොළඹ 15

**පොදු අධිකාරිය**

**ඉදිරිපිටදී :**

1. විනිසුරු උපාලි අබේරත්න (විශ්‍රාමික) - සභාපති
2. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
3. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

**පෙනී සිටීම :**

අභියාචක සූම් තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වේ.

පොදු අධිකාරිය වෙනුවෙන් අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය එච්.එම්.පී කිත්සිරි මයා (නම් කළ නිලධාරි) සහ අධ්‍යක්ෂ ඒ.බී.ඒ.කේ ගුණරත්න මයා (තොරතුරු නිලධාරි) පෙනී සිටී.

**ලිඛිත සැළකිරීම් :**

අභියාචක - 2022.01.18

පොදු අධිකාරිය - 2022.01.18

**විභාග කළ දිනය :** 2022.05.11, 2022.06.23

**තීරණය කළ දිනය :** 2022.06.23

## කොමිෂන් සභාවේ තීරණය

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක 28.06.2021 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා ඇත.

*1. X – Press Pearl නෞකාව ගිණිගෙන ගිලීමෙන් අනතුරුව මේ වන විට ලංකාවේ ඊට අදාළ මුහුදු තීරයේදී කැස්බෑවුන් කොපමණ ප්‍රමාණයක් මියගොස් තිබෙන බවට ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයට වාර්තා වී තිබෙනවාද?*

*2. පළමු ප්‍රශ්නයට අදාළව කොපමණ කැස්බෑවුන් ප්‍රමාණයකගේ පශ්චාත් මරණ පරීක්ෂණ කර තිබේද? එසේ පශ්චාත් මරණ පරීක්ෂණ කර තිබේ නම් එම පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තා ලබාදෙන්න.*

*3. පළමු ප්‍රශ්නයට අදාළව මේ සම්බන්ධයෙන් ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය ගෙන තිබෙන පියවරවල් මොනවාද යන්න සවිස්තර තොරතුරු ලබාදෙන්න.*

*4. 2016 වර්ෂයේ සිට කොපමණ කැස්බෑවුන් ප්‍රමාණයක් වාර්ෂිකව මියගොස් තිබෙනවාද යන්න වාර්ෂිකව තොරතුරු ලබාදෙන්න - එසේ මියගොස් තිබේ නම් ඒ කුමන කාරණා මතද යන්න සවිස්තර තොරතුරු ලබාදෙන්න.*

*5. X – Press Pearl නෞකාව ගිනිගෙන ගිලීමෙන් අනතුරුව කැස්බෑවුන් හැරුණුකොට මියගිය වෙනත් මුහුදු ජීවීන් වර්ග කොපමණ පමණ මියගොස් තිබෙන බවට ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයට වාර්තා වී තිබේද? ඒ කුමන මුහුදු ජීවීන්ද? එම මුහුදු ජීවීන් මියගොස් ඇත්තේ කුමන හේතූන් නිසාද යන්න පර්යේෂණ වාර්තා තොරතුරු හා පර්යේෂණ වාර්තා පිටපත් ලබාදෙන්න.*

*6. එක්ස්ප්‍රස් පර්ල් නෞකාව විනාශ වීමේ සිද්ධිය ආශ්‍රිත මුහුදු ජල සාම්පල ලබාගන්නා ලද ප්‍රදේශයන්ගේ ලැයිස්තුවක්*

*7. එම සාම්පලවල පරීක්ෂණ වාර්තා ලැයිස්තුවක්*

මෙයට ප්‍රතිචාර වශයෙන් තොරතුරු නිලධාරි විසින් 2021.07.05 දින පහත ප්‍රතිචාරය දක්වා ඇත.

*MV-Xpress Pearl නෞකාවේ සිදු වූ අනතුර සම්බන්ධයෙන් දත්ත රැස්කරමින් පවතින අතර එම දත්ත හා නිරීක්ෂණ අඩංගු වාර්තා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය සම්බන්ධීකරණයෙන් එම සිද්ධියට අදාළව පිහිටුවා ඇති විද්වත් කමිටු සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය. මෙම සිද්ධිය සම්බන්ධයෙන් එම ආයතනය සහ රජයේ නීතිපති දෙපාර්තමේන්තුව එක්ව නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් පවතින හෙයින් මෙම අවස්ථාවේදී ඔබගේ ඉල්ලීම ඉටුකළ නො හැකි බව කාරුණිකව දන්වා සිටිමි.*

*කැස්බෑවන් පිළිබඳ තොරතුරු වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ලබාගන්නා මෙන් කාරුණිකව දන්වා සිටිමි.*

මෙයින් අතෘප්තියට අභියාචක 2021.07.26 වන දින නම් කළ නිලධාරි වෙත අභියාචනයක් යොමු කර ඇති අතර නම් කළ නිලධාරි විසින් පනතේ දක්වා ඇති නිශ්චිත කාල සීමාව තුළ ප්රතිචාර දැක්වීමට අපොහොසත් වී ඇත. ඒ අනුව අභියාචක විසින් 2021.10.31 දිනැතිව කොමිෂන් සභාව වෙත ඉහත අංක දරණ අභියාචනය ඉදිරිපත් කර ඇත.

පොදු අධිකාරිය විසින් 2020.01.18 වන දින ලිපියක් අභියාචක වෙත යොමු කර පහත කරුණු දක්වා ඇත.

> *MV - Xpress Pearl නෞකාවේ සිදුවූ අනතුර සම්බන්ධයෙන් දත්ත රස කරමින් පවතින අතර එම දත්ත හා නිරීක්ෂණ අඩංගු වාර්තා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය සම්බන්ධීකරණයෙන් එම සිද්ධියට අදාලව පිහිටුවා ඇති විද්වත් කමිටු සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය. මෙම සිද්ධිය සම්බන්ධයෙන් එම ආයතනය සහ රජයේ නීතිපති දෙපාර්තමේන්තුව එක්ව නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් පවතින් හෙයින් මෙම අවස්ථාවේදී ඔබගේ ඉල්ලීමට ප්‍රතිචාර දැක්වීමේදී එම කටයුතු සඳහා බාධාවක් සිදුවිය හැකි බැවින් ඔබගේ ඉල්ලීම මෙම අවස්ථාවේදී ඉටුකළ නොහැකි බව කාරුණිකව දන්වා සිටිමි.*

**සළකා බැලීම**

මෙම අභියාචනයට අදාළව ඉදිරිපත් වී ඇති තොරතුරු ඉල්ලීමේ අයිතම අංක 01, 02, 03, 04 සහ 05 ඉල්ලීම් වලට අදාළ තොරතුරු වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ලබා ගත යුතු බවටත් මෙම පොදු අධිකාරියේ සන්තකයේ, භාරයේ හෝ පාලනයේ නොමැති බවටත් සඳහන් කර ඇත. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් තොරතුරු ලබා ගැනීම සඳහා දැනටමත් තොරතුරු ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති බවත් ඒ සම්බන්ධයෙන් අභියාචනයක් කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති බවත් අභියාචක ප්‍රකාශ කර සිටී.

ඉහත සඳහන් තොරතුරු ඉල්ලීමේ අංක 06 සහ 07 ට අදාළ තොරතුරු මුදා හැරීමට හැකි තොරතුරු බවට පොදු අධිකාරිය සඳහන් කරයි. ඒ අනුව අංක 06 සහ 07 ට අදාළ තොරතුරු කොමිෂන් සභාවට පිටපත් සහිතව, අභියාචක වෙත 07.07.2022 දිනට ප්‍රථම මුදා හැරීමට පොදු අධිකාරිය ක්‍රියා කළ යුතු බවට අපි තීරණය කරමු.

එසේ තොරතුරු ලබා දීමට පොදු අධිකාරිය අපොහොසත් වන්නේ නම් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 39 වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරියට සහ තොරතුරු නිලධාරිට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය යුතු බවට කොමිෂන් සභාව තීරණය කරයි.

**කොමිෂන් සභාවේ මෙම තීරණය පොදු අධිකාරිය, තොරතුරු නිලධාරි සහ අභියාචක වෙත දැනුම් දීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා මෙහෙයවනු ලැබේ.**

අභියාචනය අවසන් කරන ලදී.